# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය
த. பெ.இ
Po.Box No
10120

ෆැක්ස්
தொலைநகல
Fax
011-2171635

දුරකථන
தொலைபேசி
Telephone
011-2887973
(HUNTING)

වෙබ්.ලිපිනය
இணையதளம்
Web Site
www.Police.lk

ඊ මේල්
மின்னஞ்சல்
E-mail
dir.media@police.gov.lk


මගේ අංකය
எனது இலக்கம்
My NO
1462/ 2024

ඔබේ අංකය
உமது இலக்கம்
Your No
/ 2024

දිනය
திக
Date
13/09/2024
පැය 0710

## මාධ්‍ය නිවේදනය

**රූපවාහිනී නාලිකාවක විකාශය වූ පුවතක් සම්බන්දව කරුණු පැහැදිලි කිරීමක්.**

2024.09.12 වන දින එක්තරා රූපවාහිනී නාලිකාවක සවස 6.50 ප්‍රවෘත්ති විකාශය තුළින් මෙරට සංවිධානාත්මක අපරාධකරුවන් සම්බන්ධව ජාත්‍යන්තර පොලීසිය මගින් රතු වරෙන්තු ලබා ගැනීමට ඉල්ලුම් කර ඇති සැකකරුවන්ගේ නාමලේඛනය මාධ්‍ය වෙත නිකුත් කර ඇති බව සඳහන් කරමින් ප්‍රවෘත්තියක් විකාශය වූ අතර, සැකකරුවන් කිහිප දෙනෙකුගේ ඡායාරූප ඒ සමඟ ප්‍රදර්ශනය කෙරිණි.

එහිදී විදේශගතව සිටින සංවිධානාත්මක අපරාධකරුවන් වෙත රතු වරෙන්තු නිකුත් කිරීම සහ එම ක්‍රියාදාමය සිදුවන ආකාරය පිලිබඳව පොලිස් මාධ්‍ය ප්‍රකාශක තුමා විසින් දෙන ලද ප්‍රකාශයක් ද විකාශය වූ අතර, එය අදාල නාලිකාව මගින් පොලිස් මාධ්‍ය ප්‍රකාශක තුමාගේ කාර්යාලයේ දී පටිගත කරන ලද්දකි.

මෙම ප්‍රවෘත්තිය අසා සිටින අයෙකුට අදාල රතු නිවේදනය ලබා ගත් සැකකරුවන්ගේ නාමලේඛනය ශ්‍රී ලංකා පොලීසිය විසින් මාධ්‍ය වෙත නිකුත් කර තිබෙන බවට හැඟී යනු ඇත. එයට හේතුව එය නිකුත් කල යුතු එකම ආයතනය වන්නේ ශ්‍රී ලංකා පොලීසිය බැවිණි. ඒ සමඟ පොලිස් මාධ්‍ය ප්‍රකාශකගේ ප්‍රකාශයක් ද ප්‍රචාරය වන බැවින් එය තව දුරටත් නරඹන්නන් හට තහවුරු වන තත්ත්වයක් ඇති වෙනු ඇත.

මෙහිදී ශ්‍රී ලංකා පොලීසිය මගින් විදේශ ගතව සිටින සංවිධානාත්මක අපරාධකරුවන් හෝ මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් සම්බන්ධයෙන් ලබාගෙන තිබෙන රතු නිවේදන වලට අදාල කිසිදු නාම ලේඛනයක් කිසිවිටෙකත් මාධ්‍ය වෙත නිකුත් කර නොමැති අතර, **අදාල ප්‍රවෘත්ති ප්‍රකාශයේ ඒ ආකාරයට සඳහන් වීම සාවද්‍ය කරුණක් බව සියළු මාධ්‍ය වෙත අවධාරණය කරමින් දන්වා සිටිමි.**

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**